පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය -

විෂය - නර්තනය

13 ශ්‍රේණිය

සැකසීම: එම්.පී.ඩබ්.ආර්.මුතුගල
ර/ ගන්කන්ද මධ්‍ය විද්‍යාලය

# I වාරය

නිපුණතාව - 7.0 රසඥතා වර්ධනය සඳහා බහුවිධ සංස්කෘතිකාංග වල වටිනාකම විචාරයට ලක්කරයි.

නිපුණතා මට්ටම - 7.2 බටහිර බැලේ පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම - 7.2 හංසවිල /නට් ක්‍රැකර් / නිදි කුමාරිය බැලේ කෘතිය රස විඳිමු.

ඉගෙනුම් ඵල -

- හංසවිල /නට් ක්‍රැකර්/නිදි කුමාරිය බැලේ කෘතියෙහි කතා පුවත හා සබැඳි පසුබිම හඳුන්වන්න.
- එම කෘතියෙහි භාවිත රංග වස්ත්‍රාභරණ පිළිබඳ අගයමින් අදහස් දක්වයි.
- එම කෘතියෙහි භාවිත සංගීතය හා පසුබිම් සැලසුම් පිළිබඳ විචාර ඉදිරිපත් කරයි.
- රංග රචනය හා අවකාශ භාවිතයේ සුවිශේෂීතා අගයමින් අදහස් දක්වයි.
- එම කෘතියෙහි නිර්මාණයට දායක වූ ශිල්පීන්ගේ දායකත්වය විමසමින් ඇගයීමට ලක් කරයි.
- එම බැලේ කෘතිය ඇසුරු කර ගනිමින් බටහිර බැලේ වල සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

ශිෂ්‍යයා කළයුතු කාර්යයන් -

- හංසවිල /නට් ක්‍රැකර් / බැලේ නාට්‍ය දෘශ්‍ය පට ආධාරයෙන් නරඹන්න.
- එම කතා පුවත් තේරුම් ගන්නට උත්සාහ කරන්න.

ඉහත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ඉගෙනුම් ආධාරක -

- 13 ශ්‍රේණිය නර්තන අතිරේක කියවීම් පොත
- බැලේ නාට්‍ය කලාව - ආරියරත්න කලුආරච්චි
  බටහිර බැලේ හා දේශීය මුද්‍රා නාට්‍ය කලාව - රංගන සඟරාව
- **You Tube** නාලිකාව - https://youtu.be/9rJoB7y6Ncs
  https://youtu.be/tR_1LUDQuQ
  https://youtu.be/Wz_f9B4pPtg

ඇගයීම් -

- බටහිර බැලේ වල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ 02 ක් විස්තර කරන්න.
- බටහිර බැලේ චලන වල ස්වභාවය මතුකර දැක්වීම සඳහා රංග වස්ත්‍රාභරණ බෙහෙවින් ඉවහල් වේ. විමසන්න.
- උසස් නිර්මාණයක් ලෙස සමාජයේ පිළිගැනීමට ශිල්පීන්ගේ දායකත්වය වැදගත් වන ආකාරය විමසන්න.

පහත ඇගයීම් ද සිදුකරන්න.-

- සති පාසල් කාර්ය පත්‍රිකාව අංක 14 ස්වයං අධ්‍යාපනයට යොමුවන්න.

පසු ක්‍රියාකාරකම් -

- විවිධ බැලේ නාට්‍ය දෘශ්‍ය පට එක්රැස් කරන්න.
- එම බැලේ නාට්‍ය වල සුවිශේෂිතා වෙන් වෙන් වශයෙන් වගුවක දක්වන්න.
- බැලේ නාට්‍ය වල රංග වස්ත්‍රාභරණ වලට අදාළ පින්තූර එකතුවක් තබාගන්න.